# සාර්ථකත්වය රැඳී ඇත්තේ කුමක් මත ද?

ගංවතුරවල බලපෑම ඉහළ ගොස් වාර්තා වන මරණ සංඛ්‍යාව ද ඉහළ ගොස් ඇත. ඉහත සාධක සියල්ලම සැලකිමේ දී බොහොමයක් සංවර්ධනය වෙමින් පවතින රටවල ස්වාභාවික උපද්‍රවයන්ගෙන් සිදුවන ජීවිත හා දේපළ හානි උපරිම වීමට එම රටවල පවතින අධික ජන ඝණත්වය, දිළිඳුකම, නොදියුණු තාක්ෂණය, උපද්‍රව පිළිබඳ ජනතාවගේ දැනුවත්බව මඳකම, නීති හා රෙගුලාසිවල ලිහිල් බව ආදී හේතු සාධක බලපා ඇති බව පෙනී යයි. ඒ අනුව පැහැදිලි ෙ වන්නේ සංවර්ධිත රටවල වාර්තාවන උපද්‍රවයන්ගේ ප්‍රමාණය හා සමාන වුවත් ඒවායින් වැඩිම ජීවිත හා දේපළ හානි ප්‍රමාණයක් වාර්තා වනුයේ සංවර්ධනය වෙමින් පවතින රටවල බවයි. එබැවින් මෙවැනි උපද්‍රවවලින් සිදුවන හානිය අවමකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම බහුතරයක් සංවර්ධනය වෙමින් පවතින රටවල කාලීන අවශ්‍යතාවයකි.

**අනුරාධා විජේරත්න**

අවාසනාව හා කර්මය මත පදනම් ව උත්සාහයේ අගය බාල කරගත් පුද්ගලයන් සමූහයක් ජීවත් වේ. තවත් පිරිසක් පවසන්නේ ඔවුන්ට ජයග්‍රහණයේ හිණිපෙත්තට ම යාමට ධෛර්ය සැපයීමට කිසියම් කෙනෙකු නොසිටි බවයි.

තමාට ජීවිතයේ සාමාර්ථයන් අත්පත් කරගැනීමට නොහැකි වූ විට බොහෝ මිනිසුන් ඊට නිදහසට හේතු සපය යි. තමාගේ දුර්වලතාවයන් වසා ගැනීමේ අරමුණින් නිදහසට හේතු සැපයීම සිදු කරනුයේ බොහෝ මිනිසුන් ආත්ම ගෞරවය රැක ගැනීම සඳහා යැයි පවසයි.

අලස බවින් යුතුව, ක්‍රියාකාරී නොවී ආකල්පමය යහපත් වෙනසක් ඇතිකර නොගෙන නිදහසට හේතු සපයා ආත්ම ගෞරවය බේරා ගැනීමට තැත්කරන පුද්ගලයා අනතුරු සහිත ස්ථානයකින් දියට පනින්නෙකි. නිදහසට හේතු කීම ද පුද්ගල පෞරුෂයේ පවතින අඩුපාඩුවකි.

නොසැලෙන අධිෂ්ඨානය හා ධෛර්ය ඇති, අරමුණක් වෙනුවෙන් අත් නොහරින කැපවීමක් ඇති පුද්ගලයා සැබෑ වාසනාවන්තයා ය. මන්ද යත් ඒ තුළින් ජීවිතයේ ඔබට ඕනෑම සාමාර්ථයක් ලබාගත හැකි ය.

ඔබට මග පෙන්වන්නේ වෙනත් කිසිවකු නොව ඔබ ම ය. ඔබ ඔබේ වාසනාව වෙන කෙනෙකුගෙන් ඉල්ලා නොසිටින්න. "තමා හිසට තම අතමය සෙවණැල්ල" යන වදන සිහි කරන්න.

ඔබට ධෛර්ය, නොසැලෙන අධිෂ්ඨානය හා ජයග්‍රහණය දක්වා නොසැලී සිටීමේ හැකියාව නොමැති නම් ඒවා වගා දිගා කර ගන්න. ධෛර්ය හා අධිෂ්ඨානය එක් පුද්ගලයෙකුට පමණක් උරුම වූවක් නොවේ. එය මුළු මහත් ලෝකයේ සෑම පුද්ගලයෙකුට ම ළඟා කර ගත හැක්කකි. අවශ්‍ය වන්නේ ඔබ ඊට හුරු වීම ය. මේ සඳහා ඔබේ මනස ශක්තිමත් කරගත යුතු ය. ශක්තිමත් මනසක් ඇති පුද්ගලයෝ ලෞකික හා අධ්‍යාත්මික යන අංශ දෙකෙහි ම දක්ෂයෝ, නිපුණයෝ බවට පත්වෙති.

වාසනාව ඔබේ දොරකඩ සිටගෙන සිටියත් ඔබ අලසයෙකු අක්‍රිය පුද්ගලයෙකු වන්නේ නම් ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ලැබීමට ඔබට නොහැකි වන්නේ ය. ඔබ ක්‍රියාකාරී, ධෛර්ය සම්පන්න අයෙකු නම් වාසනාව හඹා ගොස් ඔබ සතු කරගත හැකි ය.

**"උසස් ප්‍රතිඵලයක් ලැබිය හැක්කේ සුළුවෙන් උත්සාහ දැරීමෙන් නොවේ"**

බොහෝ මිනිසුන් පවසන්නේ වාසනාව යනු යහමින් මුදල් ඇති බව ය. දුප්පත්කම යනු අවාසනාව බව ය. මෙය ප්‍රබල මිත්‍යා මතයකි. මන්ද යත් ලොව ශ්‍රේෂ්ඨත්වයට පත් වූ බොහෝ මිනිසුන් කුඩා කල නැළවීමට ඔවුන්ගේ දෙමාපියන්ට තොටිල්ලක්වත් තිබුණේ නැත. ඔවුන් උපන්නේ ද දුප්පත්කම උපතින් ම උරුම කරගෙන ය. නමුත් නොසැලෙන අධිෂ්ඨානය හා ධෛර්ය ඔවුන්ගේ වාසනාවට, ශ්‍රේෂ්ඨත්වයට මඟ පාදා ඇත.

**"ධනය වුවද ඔබට හිමි වන්නේ නිශ්චිත අරමුණකට කැපවී ඒ සඳහා ඔබගේ ශක්තිය හා ධෛර්ය අඛණ්ඩ ව යොමු කිරීම නිසා ඊට ලැබෙන ප්‍රතිචාරයක් වශයෙනි."**

එනම් වාසනාව රැඳී ඇත්තේ දුප්පත්, පොහොසත්කම තුළ නොවේ. එක්තරා කෝටිපති ව්‍යාපාරිකයෙකු පැවසුවේ "මට මේ තැනට එන්න මාගේ දුප්පත්කම මැණික් පතලක් වුණා" යන්න යි. ඉතා දිළිඳු පවුලක උපන් ඔහු කුඩා කල සිට ම සමාජයේ වැදගත්, පොහොසත් මිනිසෙකු වීමට සිහින මැවුවේ ය. ධෛර්ය හා නොසැලෙන අධිෂ්ඨානය මුසුකොට ඔහුගේ අරමුණු ඔහු ජයගත්තේ ය.

**"තම ඕනෑකමේ ප්‍රමාණය අනුව සාර්ථක වීමේ ප්‍රමාණය ඉහළ පහළ යයි"**

ඔබට ධෛර්ය, ආත්ම ශක්තිය, අධිෂ්ඨානය වර්ධනය කරගැනීමට අවශ්‍ය නම් ඔබේ අසාර්ථකත්වයට නිදහසට හේතු කීම නවතා දමන්න. මක් නිසාද හේතු කියමින් ඔබ අපතේ හරින කාලය ඔබේ සාර්ථකත්වයට නැවත වරක් උත්සාහ කිරීමට ඇති කාලය යි. මේ නිසා එක් වරක් පැරදුණු විට අත්හැරීම සාර්ථකත්වයේ ගමන් මඟ නිවැරදි කර ගැනීමට නැවත නැවත උත්සාහ කිරීමයි. අවසානයේ ඔබ සාර්ථක වනු නොඅනුමාන ය.

**"සාර්ථක මිනිසුන් කිසිදා නොනවතී. කිසිදා ජයග්‍රහණය හැරදා ආපසු නතර නොවේ. ජයග්‍රහණය අත්පත් කරගත් පසුත් උත්සාහ නතර කිරීමක් සිදු නොකරයි"**

සැම විටම සැම තැනකම සාර්ථකත්වයට පත් මිනිසුන් අසීමිත ධෛර්ය හා නොසැලෙන් අධිෂ්ඨානය යන අරමුණු කෙරෙහි සිත යොමු කරවූවෝ වේ ය. මේ අනුව සාර්ථකත්වය රැඳී ඇත්තේ වැදගත් කරුණු සමූහයක එකතුවක් මතයි. ඉන් කිහිපයක් පහත දැක්වේ.

1. අසීමිත ධෛර්ය
2. නොසැලෙන අධිෂ්ඨානය
3. අත්හැරීමේ ගුණය
4. දරාගැනීමේ හැකියාව
5. නොපසුබට උත්සාහය
6. කැපවීම
7. ධනාත්මක සිතුවිලි
8. සාර්ථකත්වය වෙනුවෙන් කායික හා මානසික සූදානම

ඉහත ගුණාංගයන්ගෙන් සපිරි පුද්ගලයා සැබෑ වාසනාවන්තයෙකි. එනම් සාර්ථකත්වය රැඳී ඇත්තේ ඉහත කරුණු මත ය. ඒ අනුව ඔබත් නිශ්චිත අරමුණක් වෙනුවෙන් පෙර දැක්වූ ගුණාංග මෙහෙයවා අසීමිත උනන්දුවකින් කටයුතු කළ විට සාර්ථකත්වය ඔබගේ පුරුද්දක් වනු ඇත. ඒ තුළින් ඔබ සාර්ථකත්වයට පත් අතළොස්සක් වැනි කුඩා පුද්ගල සමූහයේ සාමාජිකයෙකු බවට පත්වනු ඇත.

**ප්‍රගීත් මොහොට්ටි**